ළදරු කවි සහ ගීත

- මෙම කවි හා ගීත විසි තුනට ම රිද්මයට අත්පුඩි ගැසීමටත්, රිද්මයානුකූලව ශරීරය පැද්දීමටත් ළමයාට උගන්වන්න.

- මෙහි ඇති චිත්‍ර වර්ණ හා හැඩයන් ඉගැන්වීමට ද භාවිත කරන්න. සමහර අවස්ථාවල එක ප්‍රභේදයක එන වචන විස්තර කිරීමට රූප සටහන් දී ඇත. ඒවා ද උපයෝගී කරගෙන ළමයාගේ වචන දැනුම සිදු කළ හැකි ය.

## 1. අකරාදි සිංදුව - The Alphabet

- හඬ නඟා සිංදු කියා සංගීතය රස විඳින්න.

- ඉන්පසු සිංදු කියද්දී අකුර පෙන්වන්න.  එක් වරක් කැපිටල් අකුර - එක් වරක් සිම්පල් අකුර

- අවසානයේ ඕනෑ ම අකුරක් පෙන්වා ළමයාට එය හඬ නඟා කීමට කියන්න.

## 2. මම තේ පෝච්චියක් මි- I'm a Little Teapot

- අංග චලනය
  - 'කොට' සහ 'මහත' අතින් පෙන්වන්න
  - හැඬැලය කියද්දී එක අතක් ඉනට තබා ගන්න. ස්පවුට් (කෙමිය) පෙන්වද්දී අනෙක් අත වක්‍රව තබා ගන්න.
  - අන්තිම වාක්‍ය කියද්දී තේ පෝච්චියක් සේ පහතට නැවෙන්න.

- වචන දැනුම
  - තේවලට සම්බන්ධ වචන

| | |
|---|---|
| තේ | - Tea |
| තේ කෝප්පය | - Tea cup |
| පීරිසිය | - Saucer |
| තේ පෝච්චිය | - Tea pot |
| තේ පෙරණය | - Strainer |
| තේ හැන්ද | - Tea spoon |
| තේ කොළ | - Tea leaves |

ජෝගුව - Jug

කේතලය - Kettle

වතුර - Water

කිරි - Milk

සීනි - Sugar

- සාමාන්‍ය දැනීම

  තේ හදන ආකාරය ඔවුන්ට කියා දෙන්න

- රංගනය

  - තේ හැදීම රඟ දක්වන්න. භාවිත කරන හැම දෙයක ම නම ඉංග්‍රීසියෙන් කියා (හඬ නඟා කියවන්න)
  - අමුත්තන්ට තේ පිළිගන්වන්න

## 3. කේක් සෑදීම - Pat – a- cake, pat –a -cake

- අංගචලනය

  - මුල් පේළි දෙකට තව ළමයෙකු ඉදිරිපිට හිටගෙන එක් වරක් අත්පුඩි ගසා එක් අල්ලක් ඉදිරිපස ළමයාගේ අල්ලට ගසන්න අත හරහට යවමින්.
  - තුන්වන පේළියට කේක් එකේ සිදුරක් සාදා 'බී' අකුර ඒ මත අඳිනවා අංග චලනයෙන් පෙන්වන්න.
  - කේක් එකක් උදුනට දැමීම ව්‍යංගාර්ථයෙන් පෙන්වන්න

- වචන දැනුම

  - පිටිවලින් සෑදූ කෑම වර්ග

    පාන් - bread

    කේක් - cake

    බනිස් - buns

  - කුස්සිය - (kitchen) - තුළ තිබෙන දේ

    ගෑස් උදුන - gas cooker

    හිරමණය - coconut scraper

ශීතකරණය - refrigerator

අවන් එක - oven

- වෘත්තීන්

පාන් සාදන්නා - Baker

ලියුම් බෙදන්නා - Postman

පොලිස් නිලධාරියා - Policeman

වෛද්‍යවරයා - Doctor

ගුරුවරයා - Teacher

ගුවන් නියමුවා - Pilot

හෙද නිලධාරී - nurse

## 4. ඔබ නිදි ද ?- Are you sleeping ?

- අංග චලනය
  - අන්තිම පේළියේ සාණ්ටාරයක් ගැසීම පෙන්වන්න
- වචන දැනුම - ක්‍රියා පද

නිදියෑම - sleep
අවදිවීම - get up
හිඳගැනීම - sit
හිට ගැනීම - stand

- රඟ දැක්වීම

උදේට ඇහැරීම රඟ දක්වා පෙන්වන්න
රෑට නින්දට යෑම රඟ දක්වා පෙන්වන්න
කවුරුන් හෝ ඇහැරවීම රඟ දක්වා පෙන්වන්න

## 5. පදින්න පදින්න ඔබගේ බෝට්ටුව - **Row, Row, Row, Your Boat**

- අංග චලනය
  - එක් දරුවෙකුට මුහුණ ලා හිඳගෙන අත් දෙකෙන් අල්ලා ගෙන ඉදිරියට හා පිටු පසට පැද්දෙන්න.

- වචන දැනුම
  - වතුර මත යන ප්‍රවාහන විධි මොනවා ද?

    බෝට්ටුව
    රුවල් බෝට්ටුව
    මෝටර් බෝට්ටුව
    පාරුව

  - ගොඩබිම යන ප්‍රවාහන විධි

    දුම්රිය
    කාර් එක
    බයිසිකලය
    මෝටර් බයිසිකලය
    බසය
    ට්‍රක් රථය
    ලොරිය

  - ගුවනේ යන ප්‍රවාහන විධි

    ගුවන් යානය
    ජෙට් යානය

## 6. බා බා කළු බැටළුවෝ - **Baa Baa Black Sheep**

- අංග චලනය
  - තුන කියන විට ඇඟිලිවලින් තුන පෙන්වන්න.
  - "ඔව් සර්, ඔව් සර්" කියද්දී හිස උඩට පල්ලෙහාට වනන්න.
  - එකේ සිට දහයට ගැනීමට ඉගෙන ගන්න.

    එක - One

    දෙක - Two

    තුන - Three

    හතර - Four

    පහ - Five

හය - Six

හත - Seven

අට - Eight

නවය - Nine

දහය - Ten

- පාට සමහරක් ඉගෙන ගන්න

  කළු - Black
  සුදු - White
  නිල් - Blue
  රතු - Red
  කොළ - Green
  කහ - Yellow
  දුඹුරු - Brown

- සාමාන්‍ය දැනීම - සතුන්ගේ පාට හඳුනා ගන්න
  - බැටළුවෝ මොන පාට ද?
  - හරක් මොන පාට ද?
  - කුඹියෝ/ කපුටෝ/කොක්කු/ ගිරවු?

## 7. දිලිසෙන්න දිලිසෙන්න කුඩා තරුව - Twinkle, Twinkle, Little Star

- අංග චලනය
  - අංග චලනයෙන් ඇඟිලි එක් කිරීමෙන් තරුවක් බැබළෙනවා පෙන්වන්න
  - ඇඟිල්ලක් නිකට යට තබා සිතීම පෙන්වන්න
  - තුන්වන පේළියේ අහස පෙන්වන්න
  - අන්තිම පේළියට දියමන්ති හැඩයක් ඇඟිලිවලින් පෙන්වන්න

- දිශාවන් ඉගෙන ගැනීම (මෙම දිශාවන් ඇඟිල්ලෙන් පෙන්වන්න)
  - උඩ - up (point and look up)
  - පහළ - down (point and look down)
  - දකුණ - right (point and look right)
  - වම - left (point and look left)
  - අහස දෙස - at the sky (point and look at the sky)
  - ගස් දෙස - at the trees (point and look at the trees) ආදී වශයෙන්

## 8. හිස උරහිස දණහිස හා කකුලේ ඇගිලි

- අංග චලනය
    - සිංදුව කියද්දී ඒ ඒ ශරීර අවයවවලට ඇඟිල්ල දිගු කරන්න
      හිස- head
      උරහිස- shoulder
      දණහිස - knee
      කකුලේ ඇඟිලි - toes
      ඇස් - eye
      කන් - ear
      කට - mouth
      නහය - nose

## 9. හේ ඩිඩ්ල් ඩිඩ්ල්

- වචන දැනුම
    - සත්තු (Animals)
      පූසා - cat
      හරකා - cow
      බල්ලා - dog

    - කෑම සඳහා භාවිතා වන භාණ්ඩ (Crockery)
      හැන්ද - spoon
      දීසිය - dish
      ගෑරුප්පුව - fork
      පිඟාන - plate
      පිහිය - knife

    - සංගීත භාණ්ඩ (Music Instruments)
      වයලීනය - violin
      බෙරය - drum
      පියානෝව - piano
      ගිටාරය - guitar

    - අහසේ ඇති දේ
      හඳ - moon
      තරු - stars
      වලාකුළු - clouds
      ඉර - sun

- රංගනය
    - දීසිය හා හැන්ද මෙන් පැන දුවන්න
    - හරකෙක් මෙන් හඳ උඩින් පනින්න
    - මෙහි එන බල්ලා මෙන් සිනා සෙන්න

## 10. හිකරි ඩිකරි ඩොක් – Hickory Dickery Dock

- අංග චලනය - මෙහි හැම පේළියකට ම අංග චලනයක් ඇත.
    - අත් චක්‍රාකාරව එක උඩ එක පෙරළා "ඩොක්" කියද්දී අත්පුඩියක් ගසන්න
    - දෙවනි පේළියේ දී ඇවිදිනවා සේ ඇඟිලි සොලවමින් අත් දෙක ඔසවන්න
    - තුන්වන පේළයේ දී ඉලක්කමට එක් අත්පුඩියක් ගසා (ඉලක්කම වැඩි වන ගණනට අත්පුඩි ද වැඩි කරන්න) අත් දෙක පහළට දමන්න ඇඟිලි ඇවිදවමින්
    - නැවත මුල් පේළියට කල අංග චලනය කරන්න

- වචන දැනුම
    - සත්තු (Animals)
      මීයා - mouse
      නයා - snake
      ලේනා - squirrel
      පූසා - cat
      වඳුරා - monkey
      අලියා - elephant

    - වෙලාවන්
      එකයි - one o'clock
      දෙකයි - two o'clock
      තුනයි - three o'clock
      හතරයි - four o'clock
      පහයි - five o'clock

- සාමාන්‍ය දැනීම: වෙලාවන් කියවීමට ඉගෙන ගැනීම
    - ඔරලෝසු මුහුණතක් ඇද මිනිත්තු හා පැය කටුව උගන්වා ළමයි කෑ ගසා කියන වේලාවන් ඇඳ දැක්වීමෙන් ඔවුන්ට එම වේලාවන් කියවන විදිහ ගැන දළ අවබෝධයක් ලබා ගත හැකිය.

## 11. Incy Wincy Spider

- අංග චලනය
    - අත් දෙකේ  දබර ඇඟිල්ල හා මහපට ඇඟිලි තුඩු හුවමාරු කර එකිනෙක මත පිහිටීමෙන් ඇවිදිනවා සේ ඇඟිලි චලනය කරන්න, හිමිහිට අත් ඔසවමින්.
    - දෙවන පේළියේ දී වේගයෙන් අත් පහළට හෙලන්න, වතුරට මකුළුවා සේදී යනවා සේ.
    - තුනවන පේළයේ හිරු බබළනවා මෙන් අත් දෙක චක්‍රාකාරව දෙපසට විහිදුවන්න
    - මුල පේළියේ අංග චලනය ම නැවත කරන්න.

- වචන දැනුම

කුඹියෝ - **ant**
මී මැස්සෝ - **bee**
බත් කූරා - **dragon fly**
මදුරුවා - **mosquito**
මැස්සා - **fly**
සමනල්ලු - **butterfly**

## 12. Bingo was his name – o

- තාල ඥාණය දීම
    - හැම විටම බිංගො යන වචනයෙන් පහළට යත්ම යත්ම එක අකුර බැගින් අඩු කර ඇත, ඒ හිඩැස අත්පුඩියකින් පිරවීමෙන්. එසේ අත්පුඩි ගැසීමට ළමයින්ව හුරු කරන්න. එමගින් ඔවුන්ට හොඳ රිද්ම හා තාල දැනීමක් ලබා ගැනීමට උපකාරී වනු ඇත.

- පුළුවන්තරම් හඬ නගා බිංගො යන වචනයේ අකුරු කෑ ගසා කියන්න.

## 13. Mary had a Little Lamb

- වචන දැනුම, ගොවිපල සතුන්

හරකා - **cow**
අශ්වයා - **horse**
ඌරා - **pig**
කුකුළා - **cock**
කිකිළි - **hen**
එළුවා - **goat**

- රංගනය
  මෙම පදවල එන සිද්ධීන් රඟ දක්වන්න. දෙදෙනෙකුට මේරි හෝ බැටළුයා විය හැක. සමහර ළමයින්ට පාසලේ ළමයින් සේ රඟ පෑ හැකිය. එක් ළමයෙකුට පාසලේ ගුරුවරයා සේ බැටළුවාව එළියට දැමීටම තැත් කළ හැකිය.

## 14. One, Two, Buckle My Shoe

- අංග චලනය
  මෙහි එන ක්‍රියාවන් රඟ දක්වන්න - සපත්තුවේ බකල් එක දැමීම, දොරවැසීම, කෝටු ඇහිදීම, කෝටු කෙලින් සැකසීම

- වචන දැනුම- 1 සිට 10 දක්වා ගනින්න

- සෙල්ලම් කිරීම

| | |
|---|---|
| 1 | 2 |
| 3 | 4 |
| 5 | 6 |
| 7 | 8 |
| 9 | 10 |

මෙවැනි සටහනක් පොළොවේ ඇද, සිංදුවේ ගාණ ඇසෙද් දී අදාළ කොටුවට පනින්න.

## 15. My Father Has a Garden

- මෙම සිංදුව කිමට අපහසු විය හැක. එහෙත් එය ඇසීමෙන් වින්දනයක් ලැබිය හැකි වනු ඇත.
- වචන දැනුම
  - මල් වල නම්
    රෝස  - rose
    නෙළුම් - lotus
    පිච්ච - jasmine
  - ගස්වල නිවාස හදන සත්තු
    ගිරවා - parrot
    කපුටා - crow
    ලේනා - squirrel

- වර්ගීකරණය -
  - මොන සත්තු ද ගස්වල වෙසෙන්නේ? වතුරේ වෙසෙන්නේ? පොළොව උඩ වෙසෙන්නේ? පොළොව යට වෙසෙන්නේ?

## 16. If You are Happy and You Know It

- අංග චලනය
  - ළමයින් ට මෙම හැම පදයෙම තිබෙන ක්‍රියාව කිරීමට සලස්වන්න - අත්පුඩි ගසන්න, පාද තාලයට පොළොවේ ගසන්න හා හුරේ යැයි කෑ ගසන්න.

- ක්‍රියාකාරකම්
  - ඔබට අවශ්‍ය ක්‍රියාපද මෙම පද වලට දමා නැවත කියන්න.

    අත වනන්න - Wave your hand
    අත් පද්දන්න - Swing your arms
    කකුල් හොලවන්න - Shake your legs
    කැරකෙන්න - Turn around etc.

- වචන දැනුම
  - ක්‍රියා පද

    අත වැනීම -wave
    පැද්දීම - swing
    හෙලවීම - shake
    හැරෙන්න/ හැරීම - turn

## 17. Rock a Bye Baby

- වචන ඉගෙන ගත් පසු මෙය නැළවිලි ගීයක් සේ හෙමිහිට ගයන්න
- අංග චලනය - ළදරුවෙකු නළවන්නා සේ අත් දෙක පද්දන්න
- සාමාන්‍ය දැනීම - ගස් ගැන උගන්වන්න
  - උස, ශක්තිමත් ගස් මොනවාද ඔන්චිල්ලා එල්ලිය හැකි?
  - කුඩා ගස් මොනවා ද ඔන්චිල්ලා පැදීමට නුසුදුසු?

## 18. - Wheels on the Bus

- අංග චලනය - මේ හැම පදයකට ම ඒවාට ආවේණික වූ අංග චලනයන් ඇත.

1) ඔබගේ අත් එක මත එක පෙරළන්න
2) පුටුවක් උඩ ගැස්සෙන බව පෙන්වන්න
3) වාහනයක හෝන් එකක් ඔබනවා මෙන් "බීප් බීප්" කියන්න
4) වයිපරයක් මෙන් අත් දෙක එහාට මෙහාට කරන්න
5) අඟිලි එක් කොට විහිදුවා නැවත එක් කොට විදුලි බල්බයක් දැල්වෙනවා සේ පෙන්වන්න
6) ළමයින් දුවනවා සේ රඟන්න
7) දඹරැඟිල්ල දෙතොල් මත තබා ෂ්....... කියන්න

## 19. - Old McDonald Had a Farm -

- මෙම සිංදුව කියද්දී ඒ ඒ සත්වයන් නඟන හඬ හැකි තරම් තාත්විකව නඟන්න
- වචන දැනුම - ගොවිපළවල සිටින සතුන්

  හරකා - cow
  අශ්වයා - horse
  ඌරා - pig
  කුකුළා - cock
  කිකිළි - hen
  එළුවා - goat

- රංගනය
  - එම සත්වයින් මෙන් කෑ ගසා පෙන්වන්න. ඔබගේ සංස්කෘතිය අනුව එම සතුන් නගන හඬ කුමක් ද?

## 20. The Ants Go Marching One by One

- අංග චලනය - සෑම වාක්‍යයකට ම මෙවැනි අංගචලන කරන්න
  - එකා බැගින් එකා කියද්දී එක පේළියට සිට ගෙන ඇවිදින්න
  - 'දෙක' කියද් දී දෙදෙනෙකු එකට ඇවිදින්න
  - 'තුන' කියද්දී තිදෙනෙකු පේළියට සිට ඇවිදින්න. මෙලෙස 10 දක්වා ම කරන්න.

- පන්තිය තුළ උඩට පහලට මෙලෙස සීරුවෙන් ඇවිදින්න.
- "බූම් බූම් බූම්" යන වචන කෑ ගසා කියන්න.

- වචන දැනුම

  1 සිට 10 ට ඉංග්‍රීසියෙන් ගනින්න.

- රංගනය - ඇවිදින්න/ දුවන්න/ මාච් කරන්න/ දණ ගසන්න වැනි ක්‍රියා පද ඉංග්‍රීසියෙන් කෑ ගසා කියන්න.

  Walk - ඇවිදිනවා
  Run - දුවනවා
  March - මාච් කරනවා
  Crawl - දණ ගසනවා

## 21. Hush Little Baby

- අංග චලනය
  - ඔබේ ශරීරය රිද්මයට පද්දන්න
  - කුඩා දරුවෙකු ඔබගේ අතේ නිදියනවා සේ අත් පද්දමින් මෙම ගායනය අසන්න.

- වචන දැනුම
  - Mockingbird - 'මොකින්බර්ඩ්ස් ' නම් කුරුලු වර්ගය
    Diamond ring - දියමන්ති මුද්ද

Looking glass - මුහුණ බලන කන්නාඩිය
Billy goat - එළුවා
Cart and Bull - කරත්තය හා ගොනා
Horse and Cart - අශ්වයා හා කරත්තය

## 22. I Can Sing a Rainbow Too

- වචන දැනුම **-** දේ දුන්නේ පාට ඉගෙන ගන්න

  රතු - Red
  කහ - Yellow
  රෝස - Pink
  කොළ - Green
  දම් - Purple
  තැඹිලි - Orange
  නිල් - Blue

- ඔබ ගීතය ගායනා කරද්දී එම පාට පොතේ පෙන්වන්න. හැකි නම් වෙන ම පාට පැන්සල් හෝ පාට තීරු පිළියෙළ කර පෙන්වන්න. නැතිනම් පොතේ පින්තූර පෙන්වන්න.

- සාමාන්‍ය දැනීම **-** ඉන්ද්‍රියන් කරන්නේ කුමක්දැයි උගන්වන්න

  උදාහරණ **-** ඇස් (eye) **-** බලනවා (look)
  කන් (ear) **-** අහනවා (hear/listen)
  නහය (nose) **-** සුවඳ බලනවා (smell)
  කට (mouth) **-** රස බලනවා (taste)

- පරිකල්පනය (imagination) වර්ධනය කිරීම

  ළමයාගෙන් අසන්න, මෙම සිංදුවේ දේ දුන්නක් ගයනා කළ හැකි බව කියන්නේ ඇයිද කියා.
  (මෙයට හරි උත්තකරයක් නැත. ඔවුන්ගේ නිර්මාණ ශක්තිය පෙන්වන ඕනෑ ම උත්තරයක් බාර ගන්න. මෙම සිංදුවේ ඉන්ද්‍රයන් මගින් කරන කාර්ය ලියා ඇත්තේ මාරු කරය. ඒ ඇයි දැයි නිර්මාණශීලීව සාකච්ඡා කරන්න.)

## 23. Home on the Range

- මෙම ගීතයේ එන සතුන් ගැන ඉගෙන ගන්න.

  මී හරක් - Buffalo

  මුවෝ - Deer

- සාමාන්‍ය දැනීම - නිවසේ සෑදිය හැකි භූමි ප්‍රදේශ මොනවා ද?

  කඳු - mountains
  තැනි තලා - plains
  මුහුදු බඩ - coastal area

## Aesop's Fables

## 1. The Country Mouse and the Town Mouse

- වචන දැනුම - ක්‍රියා පද ඉගෙන ගැනීම.
  Jump - පනිනවා
  Write - ලියනවා
  Walk - ඇවිදිනවා
  Shout - කෑ ගසනවා

- ක්‍රීඩාව - සයිමන් කියනවා කියන ක්‍රීඩාව
  මෙම ක්‍රීඩාවෙන් ඕනෑම ක්‍රියා පදයක් සයිමන් කියනවා යැයි කලින් කියා කෑ ගසා කියූ විට කිරීම, හා එම ක්‍රියා පදය සයිමන් කිව්වා යන පදය නොකියා කියූ විට නොකිරීම මත පදනම් වූවකි. මෙයට අනුකූල නොවූ ලෙස ශරීරය හෙලවුවහොත් ඔහු හෝ ඇය තරඟයෙන් ඉවත් විය යුතුය.

- සාමාන්‍ය දැනීම

  නිවසේ මොන වගේ ගොඩනැගිලි ලෙස තිබිය හැකි ද?
  පැල්පත් - huts
  විශාල ගෙවල් - mansions
  රජ මැඳුරු - castles
  තට්ටු ගෙවල් - flats

  හැකි නම් මෙම වර්ගයේ ගෙවල්වල පින්තූර පෙන්වන්න

- රඟ දැක්වීම
  - මීයෝ දෙදෙනා වේගයෙන් පැන පූසාගෙන් බේරීමට දිවීම රඟ දක්වා පෙන්වන්න.
  - කොස්සක් ඔසවා දුව එන මෙහෙකාරිය රඟ දක්වන්න.
  - කෑම පිරුණු මේසයක ඉතා කෑදර ලෙස හැම දේම කන මීයන් රඟ දක්වන්න.
  - ගමේ මීයා පූසා එළියේ කෑ ගසද්දී ගුල තුළ බයේ වෙව්ලමින් සිටිනවා රඟ දක්වන්න.

## 2. The Oak and the Reed

- වචන දැනුම -
  Strong - ශක්තිමත්
  Weak - දුර්වල
  Angry - තරහ
  Scornful - සමච්චල් සහිත
  Sad - දුක්
  Proud - ආඩම්බර

- රඟ දැක්වීම
  - ඉහත කී හැඟීම් මුහුණෙන් පෙන්වන්න උගන්වන්න
- අංග චලන
  - තරහ වෙලා ඉන්න (be angry)
  - දුකෙන් ඉන්න (be sad)
  - ආඩම්බර ලෙස ඉන්න (be proud) වැනි දේ කෑ ගසා කියා ළමයින්ට එසේ සිටින බව ශරීරයෙන් පෙන්වන්නට කියන්න.

## 3. Goldilocks and the Three Bears

- වර්ගීකරණය ඉගෙන ගැනීමේ සෙල්ලම
  - විවිධ ප්‍රමාණයේ ගල් හෝ කොළ හෝ මල් හෝ ඕනෑම දෙයක් එකතු කර ගන්න. ඉන් පසු ඒවා කුඩා, මධ්‍යම හා විශාල යන ප්‍රමාණ තුනකට ගොඩවල් තුනක් හදන්න. කුඩා (Small) , මධ්‍යම (Medium), විශාල (Big)

  - ඉන් පසු, කුඩා මල් පෙන්වන්න, මට විශාල මලක් පෙන්වන්න යැයි කියමින් හරි ගොඩෙන් යමක් ඔසවා පෙන්වන්න කියන්න. මෙම ප්‍රමාණ සැම විමට සාපේක්ෂ බව ද උගන්වන්න.

- වචන දැනුම

  - පාටවල්
    Gold - රත්තරන් පාට, රන් පාට
    Black - කළු
    Brown - දුඹුරු
    Blue - නිල්
    Red - රතු

    මෙම කතාවේ පින්තූරවල එන පාට හඳුන්වා දෙන්න
    පාට පැන්සල් හෝ පාට තීරු උඩට ඔසවා එම පාට කියා දෙන්න

  - ගෘහ භාණ්ඩ - Furniture

Chair - පුටුව
Table - මේසය
Desk - ඇඳ

පින්තූරවල එන ගෘහ භාණ්ඩ නම් කරන්න

කෑමට ගන්නා භාණ්ඩ
Plate - පිඟාන
Cup - කෝප්පය
Spoon - හැන්ද

- රඟ දැක්වීම
    - ළමයි තුන් දෙනෙක් පිය වලහා, මව් වලහා හා කුඩා වලහා බවට පත් වන්න
    - වලසුන් දෙදෙනා බලා සිටිය දී ඇහැරෙන ගෝල්ඩිලොක්ස් දුවනවා රඟ දක්වන්න

- භාෂා කියමන් සමාජ අවස්ථාවල භාවිතා කරන හැටි උගන්වන්න

1. greetings - පිළි ගැනීම
   Hello - හෙලෝ
   How are you - කොහොම ද?
   Welcome - සාදරයෙන් පිළිගනිමු

2. ඇතුළට පැමිණ අවසර පැතීම
   May I come in? - මම ඇතුලට එන්න ද?

3. ඇතුල් වීමට අවසර දීම
   Please come in - කරුණාකර ඇතුලට එන්න

4. සමාව අයැදීම
   I am sorry - මට සමාවන්න
   Please forgive me - මට සමාවන්න

5. කෘතඥතාව පෙන්වීම
   Thank you - ස්තූතියි
   Thank you very much - බොහොම ස්තූතියි

   "බොහොම ස්තූතියි" කියූ විට උත්තර ලෙස Thank you හා Welcome ලෙස කිව හැකිය.

6. පිට වීම
   Good bye - බායි

- රංගනය

  මෙම අවස්ථාවවල සිටින අය සේ රඟන්න

  උදාහරණ වශයෙන් - දොරකට තට්ටු කර ඇතුළට පිවිසීමට අවසර පතන්න. දොර හැර කාව හෝ පිළිගන්න

## 4. Juno and Peacock

- වචන දැනුම
  - සතුන්

    Peacock - මොනරා

    eagle - රාජාලියා

  - විශේෂණ පද (Adjectives)

    Wide - පළල්

    Beautiful - ලස්සන

    Special - විශේෂ

    Pretty - ලස්සන

  - විශේෂණ පද සන්සන්දනය කිරීම

- රංගනය - රාජාලියෙක් වගේ පියාඹන්න

  මොනරෙක් වගේ ආඩම්බරයෙන් ඇවිදින්න

  කාගේ හෝ රූපයක් අගය කරනවා සේ රඟන්න

## 5. The Ants and the Grasshopper

- වචන දැනුම
  - Fruits - පලතුරු -

    Mango - අඹ

    Plantain - කෙසෙල් ගෙඩි

    Avocado - අලිගැටපේර

    Grapes - මිදි

    Oranges - දොඩම්

  - Vegetables - එළවළු

    Pumpkin - පුහුල්

Brinjals - වම්බටු
Ladies' Fingers - බණ්ඩක්කා
Cabbage - ගෝවා

- රඟ දැක්වීම
  - කුඹීන් මෙන් පේළියට ඇවිදින්න.
  - බර යමක් ඔසවාගෙන යනවා සේ ඇවිදින්න.
  - තණකොළ පෙත්තා සේ කම්මැලිකමින් නිදාගෙන සිටිනවා සේ පෙන්වන්න.
  - තණකොළ පෙත්තා සේ වයලීනය වාදනය කරන්න. සිංදු කියන්න.

- විරුද්ධ පද උගන්වන්න
  - Cold (සීතල) – Warm (උණුසුම්)
  - Hard Work (හොඳින් වැඩ කරන) - Lazy (කම්මැලි)
  - Intelligent (බුද්ධිමත්) – Stupid මෝඩ)
  - Slow (හෙමින්) –Past (ඉක්මන්)

- ක්‍රියා විශේෂ උගන්වන්න (Adverbs)
  - මෙම ක්‍රියා විශේෂයන් හා ක්‍රියා පද කෑ ගසා කියා ළමයින්ට ඒවා පිළිබඳ උපදෙස් දෙන්න.
    Walk slowly
    Run fast
    Shout loudly
    Speak softly

## 6. The Wind and the Sun

- පාටවල් - පින්තූරයෙහි ඇති පාට හඳුනා ගන්න.
- වචන දැනුම - විශේෂණ පද සංසන්දනය කිරීම
  - තොප්පියක් දමා සිටින කෙනෙක් තදින් (tight), වඩාත් තදින්(tighter), වඩාත්ම තදින්(tightest) තොප්පිය අල්ලා සිටිනවා රඟන්න.
  - එම ආකෘතිය නැවත නැවත පෙන්වන්න.
    - ශක්තිමත් (strong), වඩාත් ශක්තිමත් (stronger), වඩාත්ම ශක්තිමත්(strongest)
    - බලවත් (powerful), වඩා බලවත් (more powerful ), වඩාත්ම බලවත් (most powerful )

○ ළමයින්ට වේගයෙන්(fast), තව වේගයෙන්(faster), වඩාත්ම වේගයෙන්(fasterst) දුවන්න උපදෙස් දෙන්න.

- රඟ දැක්වීම
  - හුළං මෙන් රඟ පාමින් හැම තැනම පිඹිමින් දුවන්න
  - හුළඟට විසි නොවී අමාරුවෙන් ඇවිදින මිනිසෙකු සේ රඟන්න.

## 7. Look Before You Leap

- ඍතු ගැන ඉගෙන ගන්න. (සර්ම කලාපීය රටවල)

  Monsoon - මොසම

  Drought - නියඟය

- වචන දැනුම
  - Spring - වසන්තය
  - Summer - ගිම්හානය
  - Autumn - සරත් සමය
  - Winter - හේමන්තය

- රඟ දැක්වීම
  - මාළුවෙක් මෙන් පීනන්න (Swim)
  - හංසයන් සේ ලස්සනට පීනන්න (Glide)
  - තාරාවෝ සේ ඇවිදින්න (Waddle)

- සාමාන්‍ය දැනීම
  - පොකුණක සාමාන්‍යයෙන් සිටින සත්තු කවුද? වතුරවල විතරක් ජීවත්වන සතුන් සත්තු කවුද? ගොඩබිමේ හා වතුරේ ජීවත්වන සත්තු කවුද?

## 8. The Boy Who Cried Wolf

- වචන දැනුම - සතුන්
  - Sheep - බැටළුවා
  - Wolf - වෘකයා
  - Horse - අශ්වයා
  - Lamb - බැටළු පැටියා
  - Goat - එළුවා
  - Fox - නරියා

- වර්ගීකරණය - සතුන්
  - Predators - අන් සතුන් කන සතුන්

    Lion - සිංහයා

    Tiger- කොටියා
  - Herbivores - ශාක ආහාර පමණක් ගන්නා සතුන්

    Rabbit - හාවා

    Deer - මුවා

- Omnivores - ශාක මූලික හා මස් කන සතුන්
  Cat - පූසා
  Dog - බල්ලා

- ගොවිපළ සතුන් (farm animals) හා වන සතුන් (wild animals)

ඉහත කී සත්වයන් මොන වර්ගයට අයත් දැයි ළමයින්ගෙන් අසන්න.

- රඟ දැක්වීම
  - කෑ ගසමින් උදව් ඉල්ලා කන්ද පහළට දුවන ළමයින් මෙන් රඟන්න
  - බැටළුවන්ව බය කරන වෘකයා මෙන් රඟන්න
  - බය වී රවුමට රවුමට කැරකෙන බැටළුවන් සේ රඟන්න
  - උදව් කිරීමට කඳු මුදුනට දුවන ගම් වැසියන් මෙන් රඟන්න